සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**87 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020**
**General Certificate of Education (Ord. Level) Examination, 2020**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II**
**தொடர்பாடலும் ஊடகக் கல்வியும் I, II**
**Communication and Media Studies I, II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. සන්නිවේදනය ද්වි-මාර්ගික ක්‍රියාවලියකි. මෙයින් අදහස් වන්නේ,
   (1) සන්නිවේදනයේ දී ග්‍රාහකයකු සිටිය යුතු බවයි.
   (2) ප්‍රතිපෝෂණයක් සිදුව නැති බවයි.
   (3) සන්නිවේදකයා ග්‍රාහකයා විය හැකි බවයි.
   (4) ඝෝෂා අවම මට්ටමක ඇති බවයි.

2. සිතියමක් අයත් වන්නේ,
   (1) ලිඛිත, දෘශ්‍ය සන්නිවේදනයට ය.
   (2) අවිධිමත්, දෘශ්‍ය සන්නිවේදනයට ය.
   (3) නිර්වාචික, විධිමත් සන්නිවේදනයට ය.
   (4) විධිමත්, අලිඛිත සන්නිවේදනයට ය.

3. එක් අයෙකු විසින් වැඩි පිරිසක් වෙත තොරතුරු සන්නිවේදනය කරනු ලබන අවිධිමත් සන්නිවේදන විධි ක්‍රමය වන්නේ,
   (1) පර්ෂද දාමයයි. (2) තනි දාමයයි. (3) ඕපාදූප දාමයයි. (4) සම්භාවිතා දාමයයි.

4. අර්ථකථනය කරමින් සන්නිවේදනයේ යෙදීම අයත් වන්නේ,
   (1) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයටයි. (2) අන්තර්පුද්ගල සන්නිවේදනයටයි.
   (3) සමූහ සන්නිවේදනයටයි. (4) ජන සන්නිවේදනයටයි.

5. කෙනෙකුගේ පංචේන්ද්‍රියයන් මගින් ලැබෙන සංදේශ ග්‍රහණය කරගෙන එය තේරුම් කර ගැනීම
   (1) අර්ථකථනයයි. (2) සංජානනයයි.
   (3) සන්නිවේදනයයි. (4) බලපෑමයි.

6. රූපවාහිනී මාධ්‍යයේ ලක්ෂණයක් වන්නේ,
   (1) සන්නිවේදක හා ග්‍රාහක අභිමුඛවීමයි. (2) නිශ්චිත ග්‍රාහක පිරිසක් සිටීමයි.
   (3) ද්විමාර්ගික සන්නිවේදනයක් සිදුවීමයි. (4) පොදු සංදේශ ඉදිරිපත් කිරීමයි.

[දෙවැනි පිටුව බලන්න.

7. ටෙලි නාට්‍යයක් නරඹමින් සිටින අතරතුර එහි එක් ජවනිකාවක් හේතුවෙන් ඔබේ මුවට සිනහවක් පහළ වූයේ යැයි සිතන්න. මෙහිදී සිදුවූයේ,
(1) ඍජු පෙළඹවීමකි. (2) ප්‍රතිපෝෂණ ක්‍රියාවකි.
(3) උත්තේජන ප්‍රතිචාරයකි. (4) ද්විමාර්ගික සන්නිවේදනයකි.

8. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි තොරතුරු ලැබීමට හා දීමට ඇති අයිතිය තහවුරු කෙරෙන වගන්තිය කුමක් ද?
(1) 15 (i) (2) 15 (ii) (3) 19 (4) 21

9. පුවත්පතක ප්‍රවෘත්ති පිටුව සංස්කරණය කරනු ලබන්නේ,
(1) ප්‍රධාන කර්තෘ විසිනි.
(2) නියෝජ්‍ය කර්තෘ විසිනි.
(3) උප කර්තෘවරයෙක් විසිනි.
(4) මාණ්ඩලික වාර්තාකරුවෙක් විසිනි.

10. ටැබ්ලොයිඩ් (Tabloid) සහ බ්‍රෝඩ් ෂීට් (Broad Sheet) ආදි ලෙස පුවත්පත් බෙදා දැක්වීමේ දී මූලික වී ඇත්තේ
(1) පුවත්පතෙහි ප්‍රමාණයයි. (2) පුවත්පත පළවන වාරයයි.
(3) කේන්ද්‍රීය විෂයයි. (4) භාවිත කරන පාඨකයායි.

11. සියලු ආගම් හා ජාතීන්ට ගරු කිරීම, නීතිගරුකභාවය, ආචාරශීලීත්වය හා ඡන්ද අයිතිය යන කරුණු ඍජුව අදාළ වන්නේ,
(1) මානව හිමිකම්වලට ය. (2) ප්‍රජාතන්ත්‍රවාදයට ය.
(3) පුරවැසිභාවයට ය. (4) වාර්ගිකත්වයට ය.

12. දීර්ඝ කාලයක් තිස්සේ කරනු ලබන පර්යේෂණ මත පදනම් වූ රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදය වනුයේ,
(1) සජීවී විස්තර කථනයන් ය. (2) ප්‍රවෘත්ති වැඩසටහන් ය.
(3) රියැලිටි වැඩසටහන් ය. (4) වාර්තා වැඩසටහන් ය.

13. මාධ්‍ය සංදේශ පරිහරණය කිරීමේ දී, විචාරශීලි ග්‍රාහකයෙක් සතු ලක්ෂණයක් **නොවන්නේ**, පහත සඳහන් ඒවායින් කුමක් ද?
(1) විශ්ලේෂණ කිරීමයි.
(2) වගකීමෙන් පරිහරණය කිරීමයි.
(3) අන්තර්ගතය එලෙසම ජීවිතයට ආදේශ කර ගැනීමයි.
(4) නිර්මාණය කිරීමේ අරමුණු හඳුනාගැනීමයි.

14. ඔබ පාසලේ පැවැත්වෙන ක්‍රීඩා තරඟයක් එම මොහොතේ දී ම ගුවන්විදුලි මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කිරීම සඳහා යොදා ගත හැකි වැඩසටහන් ආකෘතිය වන්නේ,
(1) ප්‍රවෘත්ති වැඩසටහනකි. (2) වාර්තාමය වැඩසටහනකි.
(3) නිවේදනයකි. (4) විස්තර ප්‍රචාරයකි.

15. රූපවාහිනී නාලිකාවක් ආරම්භ කිරීම සඳහා බලපත්‍ර ලබා ගැනීමේ දී ඍජුව මැදිහත් වන ආයතනයක් වන්නේ,
(1) ජනමාධ්‍ය අමාත්‍යාංශයයි. (2) විදුලි සංදේශ නියාමන කොමිසමයි.
(3) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවයි. (4) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයයි.

16. මාධ්‍ය කර්මාන්තයේ සාර්ථකත්වය රඳා පවතිනුයේ ග්‍රාහකයාගේ,
(1) රුචි අරුචිකම් මතයි. (2) පාරිභෝගික වටිනාකම මතයි.
(3) සංදේශ ප්‍රතිග්‍රහණය මතයි. (4) මාධ්‍ය සාක්ෂරතාව මතයි.

17. පුවත්පතට හා රූපවාහිනියට සාපේක්ෂව ගුවන්විදුලිය සුවිශේෂ වන්නේ එහි දී
(1) හඬ භාවිත කෙරෙන බැවිනි. (2) භූගෝලීය බාධක විරල බැවිනි.
(3) සාක්ෂරතාව අත්‍යවශ්‍ය නොවන බැවිනි. (4) පුද්ගල කේන්ද්‍රීය වූවක් බැවිනි.

[තුන්වැනි පිටුව බලන්න.

18. ඔබ අතැති නිල මුද්‍රාව සහිත ලේඛනයක් ක්ෂණිකව වෙනත් දුරස්ථ ස්ථානයක් වෙත යොමු කිරීම සඳහා යොදා ගත හැකි උපකරණය වන්නේ,

(1) ඩිජිටල් අනුපිටපත් යන්ත්‍රයයි. (2) තැපැල් මුද්‍රා යන්ත්‍රයයි.
(3) විද්‍යුත් කැඳවනයයි. (4) ෆැක්ස් යන්ත්‍රයයි.

19. ජාතික නිදහස් දිනයේ දී විකාශනය කිරීම සඳහා රූපවාහිනී නාට්‍යයක් නිර්මාණය කිරීමට ඔබ පාසලේ නාට්‍ය ඒකකයට අවස්ථාව ලැබී ඇත. මේ සඳහා නිර්මාණය කිරීමට උචිත ටෙලි නාට්‍ය වර්ගය වන්නේ,

(1) ප්‍රාසංගික නාට්‍යයකි. (2) ඒකාංගික නාට්‍යයකි.
(3) විවිධාංගික නාට්‍යයකි. (4) මෙගා නාට්‍යයකි.

- ප්‍රශ්න අංක **20** සිට **22** දක්වා පිළිතුරු සැපයීම සඳහා පහත දක්වා ඇති යටිකුරු පිරමිඩ ආකෘතිය භාවිත කරන්න.




20. කිසියම් ප්‍රවෘත්තියකට ඍජුව සම්බන්ධ වූවන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුළත් වීමට වඩාත් ම ඉඩ ඇත්තේ,

(1) A හි ය. (2) D හි ය. (3) B හෝ C හි ය. (4) C හෝ D හි ය.

21. පුවත්පත මුද්‍රණයට ආසන්න ව තිබිය දී වාර්තා වූ වැදගත් පුවතක් නිසා විස්තරාත්මක තොරතුරු ඇතුළත් පුවතින් කොටසක් ඉවත් කිරීමට සිදුවිය. එසේ ඉවත් කිරීමට වඩාත් සුදුසු කොටස වන්නේ,

(1) A ය. (2) D ය. (3) B හෝ C ය. (4) C හෝ D ය.

22. මෙම ආකෘතිය වඩාත් ගැළපෙන්නේ කවර ප්‍රවෘත්ති වාර්තා කිරීමට ද?

(1) දෘඪ ප්‍රවෘත්ති (2) මෘදු ප්‍රවෘත්ති (3) සංවේදී ප්‍රවෘත්ති (4) පාරිසරික ප්‍රවෘත්ති

23. '<u>SFX - ඉරිදා වෙළෙඳපොළක්</u>' යනුවෙන් අදහස් කෙරෙන්නේ,

(1) දුර රූපයකි. (2) ශබ්ද ප්‍රයෝගයකි.
(3) සංස්කරණ උපදෙසකි. (4) සන්නිවේදන ඝෝෂාවකි.

24. පුවත්පතක් සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

- කර්තෘ හිමි පුවත්පතකි.
- 1909 දී ආරම්භ විය.
- එච්.එස්. පෙරේරා මහතා පුරෝගාමියා විය.

උක්ත කරුණුවලට අදාළ පුවත්පත වන්නේ,

(1) ඥානාර්ථ ප්‍රදීපයයි. (2) සිංහල බෞද්ධයායි.
(3) දිනමිණයි. (4) ලංකාලෝකයයි.

25. රවී විසින් අධ්‍යක්ෂණය කර සංගීත සංයෝජනය කළ කෙටි චිත්‍රපටයක් පන්ති කාමරය තුළ ප්‍රදර්ශනය කිරීමට ඔහුට අවශ්‍ය විය. මේ සඳහා යොදා ගත යුතු උපකරණය වන්නේ,

(1) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. (2) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
(3) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. (4) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.

26. රාජ්‍ය හිමිකාරිත්වය සහිත මාධ්‍ය පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) ජාතික රූපවාහිනිය, ස්වාධීන රූපවාහිනිය, ලංකාදීප පුවත්පත
(2) ස්වදේශීය සේවය, ලක්හඬ ගුවන්විදුලිය, දිවයින පුවත්පත
(3) ස්වාධීන රූපවාහිනිය, ලක්හඬ ගුවන්විදුලිය, ලංකාදීප පුවත්පත
(4) ජාතික රූපවාහිනිය, ලක්හඬ ගුවන්විදුලිය, සිළුමිණ පුවත්පත

[හතරවැනි පිටුව බලන්න.

**27.** චිත්‍රපට රූගත කිරීම්වල දී අංග රචනය, වස්ත්‍රාභරණ හා පසුතල නිර්මාණ ආදියෙහි අඛණ්ඩතාව පවත්වා ගැනීමට වඩාත් ප්‍රයෝජනවත් වන්නේ,

(1) සංස්කරණයයි. (2) නිශ්චල ඡායාරූපකරණයයි.
(3) අධ්‍යක්ෂකගේ භූමිකාවයි. (4) පිටපතෙහි පැහැදිලි බවයි.

**28.** කොරෝනා රෝගය වැළඳුනු පුද්ගලයින් පිළිබඳ රූපවාහිනිය ඔස්සේ වාර්තා කිරීමේ දී ඔවුන්ගේ අනන්‍යතාව හෙළි නොකර සිටීමට මාධ්‍ය ආයතන විසින් කටයුතු කරන ලදී. මෙම තත්ත්වයට සෘජුව අදාළ වන්නේ,

(1) මාධ්‍ය ආචාරධර්මයි. (2) සන්නිවේදන බාධකයි.
(3) සිතුවිලි හසුරුවා ගැනීමයි. (4) සංජානනයයි.

**29.** ශ්‍රී ලංකාවේ පළවන පොතකට ISBN (International Standard Book Number) ලබාදෙන්නේ,

(1) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙනි.
(2) පොත් ප්‍රකාශකයන්ගේ සංගමයෙනි.
(3) ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙනි.
(4) පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශයෙනි.

**30.** ග්‍රන්ථයක කර්තෘ භාගය (Royalty) ලැබීම යනු

(1) මුද්‍රිත කෘති ප්‍රමාණයෙන් අඩක් කර්තෘට හිමිවීමයි.
(2) කෘතිය අලෙවියෙන් ලද මුදලින් අඩක් කර්තෘට හිමිවීමයි.
(3) මුද්‍රිත පිටපත් ප්‍රමාණය මත යම් මුදලක් කර්තෘට හිමිවීමයි.
(4) කර්තෘගේ ජීවිත කාලයෙන් පසුව ද හිමිකම ලැබීමයි.

**31.**



ඉහත දක්වා ඇත්තේ,

(1) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් වන අතර එය භාවිතයේ දී පූර්ව සූදානමක් අවශ්‍ය ය.
(2) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් වන අතර ඒ සඳහා විනිවිදක පත්‍ර අවශ්‍ය වේ.
(3) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් වන අතර එහි කාචය සීරු මාරු කළ හැකි ය.
(4) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් වන අතර එය දුරස්ථ පාලකයක් මගින් ක්‍රියාත්මක කළ හැකි ය.

**32.** චීන, කොරියානු හා ජපන් අක්ෂර හැඳින්වීමට වඩාත් යෝග්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ප්‍රාග් මානව භාෂාවලින් විකාශය වී ඇත.
(2) බටහිර භාෂා මූලයන්ගෙන් පෝෂණය වී ඇත.
(3) රූපාක්ෂර හෝ චිත්‍රාක්ෂර ලෙස විකාශය වී ඇත.
(4) කථන භාෂා මුල් කරගෙන ලේඛන භාෂා බවට පත් වී ඇත.

**33.** වැඩසටහන් විකාශනයේ දී භූගෝලීය සීමා පිළිබඳ අවම සැලකිල්ලක් දක්වන්නේ,

(1) ඩිජිටල් ගුවන්විදුලියයි. (2) වෙබ් ගුවන්විදුලියයි.
(3) ප්‍රජා ගුවන්විදුලියයි. (4) එෆ්.එම්. ගුවන්විදුලියයි.

34. රාමා පාසල් නිවාඩු කාලයක දී සිනමාව හා රූපවාහිනියට වඩා පුවත්පත් හා ගුවන්විදුලි මාධ්‍ය ඇසුරු කළේ ය. මේ කාලය තුළ දී නිර්මාණශීලී සිතුවිලි වැඩි වශයෙන් පහළ වන බව ඔහුට අවබෝධ විය. ඊට හේතුව වන්නේ,
    (1) පරිකල්පනයයි.
    (2) අවබෝධයයි.
    (3) පුනර්භාවිතයයි.
    (4) අතිශෝක්තියයි.

35. මාධ්‍ය ක්‍රියාකාරිත්වය කෙරෙහි රජයේ වක්‍ර මැදිහත්වීමක් පෙන්නුම් කරන අවස්ථාවක් වන්නේ,
    (1) හදිසි අවස්ථාවල දී ව්‍යවස්ථානුකූල ව සංදේශ පාලනය කිරීමයි.
    (2) ජාතික ආරක්ෂාවට එරෙහි අවස්ථාවල දී වාරණ නියෝග පැනවීමයි.
    (3) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය මගින් ආචාරධර්ම පද්ධතියක් ඉදිරිපත් කිරීමයි.
    (4) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මාධ්‍ය නාලිකා සඳහා බලපත්‍ර නිකුත් කිරීමයි.

36. කොරෝනා අවදානම හමුවේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා භාවිත කිරීමට වඩාත් සුදුසු මාධ්‍ය යුගලය වනුයේ,
    (1) පුවත්පත හා ගුවන්විදුලියයි.
    (2) ගුවන්විදුලිය හා රූපවාහිනියයි.
    (3) රූපවාහිනිය හා අන්තර්ජාලයයි.
    (4) පුවත්පත හා අන්තර්ජාලයයි.

37. සන්නිවේදන ඉතිහාසයේ සංධිස්ථාන කිහිපයක් පහත දැක්වේ.

    A - කථන භාෂාවක් සකස් කර ගැනීම
    B - කඩදාසි සොයා ගැනීම
    C - රූපාක්ෂර නිර්මාණය කර ගැනීම
    D - හෝඩිය නිර්මාණය කර ගැනීම

    මෙහි කාලානුක්‍රමික අනුපිළිවෙළ වන්නේ,
    (1) A, B, C හා D ය. (2) A, C, B හා D ය. (3) A, C, D හා B ය. (4) C, A, B හා D ය.

38. පුවත්පතක අන්තර්ගත විවිධ තොරතුරු පිළිබඳ අදහස් කිහිපයක් පහත දැක්වේ.

    A - හාස්‍ය හා උපහාසය දනවමින් තොරතුරු නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි.
    B - බලපෑම් සහගත තොරතුරු ඇතුළත් ව රචනා කරයි.
    C - පුවත්පතේ රිද්මය හඳුනා ගත හැකි ලියවිල්ලකි.

    ඉහත ප්‍රකාශ සඳහා අදාළ වන ආකෘති පිළිවෙලින්,
    (1) කාටූන්, ප්‍රවෘත්ති හා සංස්කාරක වැකිය වේ.
    (2) ඡායාරූප වාර්තා, තීරු ලිපි හා ප්‍රවෘත්ති වේ.
    (3) විශේෂාංග ලිපි, ප්‍රවෘත්ති හා තීරු ලිපි වේ.
    (4) කාටූන්, විශේෂාංග ලිපි හා සංස්කාරක වැකිය වේ.

39. ඡායාරූපකරණයේ අනාවරණ ක්‍රියාවලියට අයත් කාර්යයක් වන්නේ,
    (1) රූපරාමුව තුළ අඩංගු වස්තූන් නිසි පරිදි සංවිධානය කිරීමයි.
    (2) ඡායාරූපයට හසුකර ගන්නේ කුමක්ද යන්න තීරණය කිරීමයි.
    (3) ඡායාරූපයට හසුකර ගන්නා අරමුණ පැහැදිලි වන සේ කාචය සීරුමාරු කිරීමයි.
    (4) කාච විවරයේ හා ද්වාරයේ පිහිටීම නිසි පරිදි සකස් කොට ආලෝකය පාලනය කිරීමයි.

40. පහත ප්‍රකාශ සළකන්න.

    A - ග්‍රාහක චර්යා වෙනස් කරයි.
    B - පුද්ගල න්‍යාය පත්‍රය හසුරුවයි.
    C - ග්‍රාහක සිතුවිලි හා ආකල්ප හසුරුවයි.
    D - ග්‍රාහක ප්‍රතිචාර පිළිබඳ සැලකිලිමත් වෙයි.

    මේ අතුරෙන් ග්‍රාහකයා කෙරෙහි මාධ්‍ය බලපෑම පෙන්නුම් කරන්නේ,
    (1) A හා B හි පමණි.
    (2) A, B හා C හි පමණි.
    (3) B, C හා D හි පමණි.
    (4) C හා D හි පමණි.

* *

[හයවැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

87 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I, II
Communication and Media Studies I, II

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු **20**ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

**1.** මාධ්‍යවේදිනියක් සමාජ අසාධාරණයට එරෙහිව කරන අරගලය, සිංහලට හඬ කවා විකාශය වන ඉන්දියානු ටෙලි නාට්‍යයක කතා ප්‍රවෘත්තියයි.

(i) ටෙලි නාට්‍යයකින් අපේක්ෂා කරන සන්නිවේදන කාර්යය කුමක් ද?

(ii) ඉහත ටෙලි නාට්‍යය අඩු වියදමකින් නමුත් කොටස් වැඩි ගණනක් සහිත ව විකාශනය වන්නේ නම් එය අයත් ටෙලි නාට්‍ය වර්ගය කුමක් ද?

(iii) විදේශ ටෙලි නාට්‍ය විකාශනය කිරීමේ දී ඍජු රාජ්‍ය මැදිහත්වීමක් පෙන්නුම් කරන ආකාරය කුමක් ද?

(iv) ඉහත නිර්මාණයට සමාන වූවක් මෙරට දී නිෂ්පාදනය කරන්නෙකුගේ ආර්ථික අයිතිය හා සදාචාරාත්මක අයිතිය තහවුරු කෙරෙන ප්‍රධාන නෛතික තත්ත්වය කුමක් ද?

(v) ටෙලි නාට්‍ය ඇසුරෙන් අසන ලද පැනයකට පිළිතුරු ලබා දී ත්‍යාග දිනා ගැනීමට ප්‍රේක්ෂකයෙකු සිතුවේ ය. මෙම සිතුවිල්ල අයත් සන්නිවේදන වර්ගය කුමක් ද?

(vi) අකුණු ගැසීම නිසා ටෙලි නාට්‍ය නැරඹීම අතරමග නවතා දමන්නට සිදුවිය. මෙය කුමන සන්නිවේදන බාධාවක් ද?

(vii) ටෙලි නාට්‍යයේ නිර්මාණාත්මක ලක්ෂණ පිළිබඳ විචාරයක් පුවත්පතක පළ වුණි නම් එම ලිපි ආකෘතිය කුමක් ද?

(viii) ටෙලි නාට්‍ය විකාශනය වී, කෙටි කාලයක් තුළ එය සමාජ මාධ්‍යට උඩුගත කරයි. ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය අතර සුසංයෝගවීමේ මෙම සංකල්පය හඳුන්වන යෙදුම කුමක් ද?

(ix) ඉහත ටෙලි නාට්‍යය ගුවන්විදුලි නාට්‍යයක් බවට පත් කිරීමේ දී භාවිත කළ හැකි ප්‍රධාන හඬ වර්ග දෙකක් නම් කරන්න.

(x) ඉහත ටෙලි නාට්‍යයේ මාධ්‍යවේදිනියගේ භූමිකාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී යොදා ගත හැකි සමාජ විද්‍යාත්මක සංකල්පය කුමක් ද?

**2.** මැතිවරණ සමයේ දී අපේක්ෂකයකු තම මාධ්‍ය ප්‍රචාරණය පිළිබඳ ව වඩාත් සැලකිලිමත් විය යුතු ය.

(i) ජනතාව ඇමතීමේ දී තමා ඉදිරියේ සිටින සමූහය සමග අපේක්ෂකයා ඇස් සබඳතා පවත්වයි. මෙම ක්‍රියාව හඳුන්වන යෙදුම කුමක් ද?

(ii) මැතිවරණ කාර්යාලයක මාධ්‍ය ක්‍රියාවලියට අදාළ තොරතුරු පාදක කාර්ය දෙකක් නම් කරන්න.

(iii) මැතිවරණයට අදාළව ප්‍රවෘත්ති ඡායාරූපයක් ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) මැතිවරණයක දී පෝස්ටර් භාවිතයේ ප්‍රබලතා හතරක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

**3.** පුවත්පත හා ඡායාරූප අතර ඇත්තේ ඉතා සමීප සම්බන්ධයකි.

(i) පළ කෙරෙන වාරය අනුව පුවත්පත් වර්ග දෙකක් නම් කරන්න.

(ii) පුවත්පත් වාර්තාවක් සඳහා තෝරා ගනු ලබන ඡායාරූපයක තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ දෙකක් දක්වන්න.

(iii) සමකාලීන විද්‍යුත් පුවත්පත්වල දක්නට ලැබෙන පොදු ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න.

(iv) පුවත්පතක නිශ්චල ඡායාරූප යොදා ගැනීමේ වාසි හතරක් වෙන වෙන ම පැහැදිලි කරන්න.

[හත්වැනි පිටුව බලන්න.

4. සන්නිවේදනයේ ස්වභාවය පැහැදිලි කර ගැනීම සඳහා එහි වර්ග සහ ස්වරූප පිළිබඳ අවබෝධය වැදගත් වේ.

(i) පොදු සංදේශ සහ සංවිධානාත්මක ආයතනයක් යන ලක්ෂණ දක්නට ලැබෙන සන්නිවේදන වර්ගය කුමක් ද?

(ii) ලිඛිත භාෂාවේ විධිමත් බව පෙන්නුම් කරන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(iii) ඵලදායි ලේඛනයක් හඳුනා ගැනීමට උපයෝගී කර ගත හැකි සාධක තුනක් පැහැදිලි කරන්න.

(iv) 'සන්නිවේදනයේ මූලික කාර්යයන් හතරක්' මැයෙන් සංදේශය නමැති සඟරාවට ලිපියක් සම්පාදනය කරන්න.

5. (i) ශ්‍රී ලංකාවේ පළමු පෞද්ගලික පුවත්පත් ව්‍යාපාරය කුමක් ද?

(ii) දේශීය ජනමාධ්‍ය ස්ථාපනය කිරීමේ දී දෙයාකාරයක පනත් මූලික විය. එම පනත් වර්ග දෙක මොනවා ද?

(iii) ජනමාධ්‍ය ආයතනයක අභ්‍යන්තර සේවකයන් දැනුවත් කිරීමේ වැඩමුළුවක දී බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් භාවිත කිරීමේ ප්‍රයෝජන තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ජනමාධ්‍ය ආයතනවල අභ්‍යන්තර කටයුතු සඳහා පහත සඳහන් එක් එක් උපකරණය භාවිත කිරීමේ අවශ්‍යතා දෙක බැගින් වෙන වෙන ම කෙටියෙන් විස්තර කරන්න.

- දින මුද්‍රා යන්ත්‍රය
- නිල මුද්‍රා යන්ත්‍රය
- තැපැල් මුද්‍රා යන්ත්‍රය
- මුදල් සටහන් යන්ත්‍රය

6. (i) ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍යවලට අදාළ ආචාරධර්ම පද්ධතියක් නම් කරන්න.

(ii) පුවත්පතක පළවූ ලිපියක් සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා භාවිත කළ හැකි විධික්‍රම දෙකක් දක්වන්න.

(iii) ජනමාධ්‍යවලින් නව මාධ්‍ය වෙනස් වන ආකාර තුනක් පැහැදිලි කරන්න.

(iv) නිර්මාණාත්මක සන්නිවේදනයේ දී යොදා ගත හැකි ප්‍රකාශන විධි දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න.

7. කොවිඩ් 19 වසංගතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක දී වෛද්‍යවරයා විවිධ වාගලංකාර හා භාව ප්‍රකාශන යනාදිය භාවිත කරමින් අර්ථවත් දේශනයක් සිදු කළේ ය.

(i) ඉහත වාචික සන්නිවේදන අවස්ථාවේ දී වෛද්‍යවරයා භාවිතයට ගෙන ඇති භාෂා අංගය කුමක් ද?

(ii) ඉහත වසංගත අවස්ථාවට විශේෂිත ගුවන්විදුලි නිවේදනයකට අදාළ කොටස් දෙකක් නම් කරන්න.

(iii) වසංගත තත්ත්වය පිළිබඳ තොරතුරු රැස් කරන්නෙකු ලෙස ඔබ ඉහත වැඩසටහනට සහභාගි වන්නේ නම්, ඔබ තුළ තිබිය යුතු ගුණාංග තුනක් කෙටියෙන් විස්තර කරන්න.

(iv) ඉහත වාතාවරණය තුළ දීර්ඝ කාලයක් ළමයින් රූපවාහිනිය නැරඹීමට පෙළඹීම නිසා සිදුවිය හැකි යහපත් හා අයහපත් බලපෑම් දෙක බැගින් විස්තර කරන්න.

* * *